නෙත් FM

# 5 පහේ පන්තිය

**නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. පොදු දේපල ආරක්ෂා කළ යුත්තේ ඇයි?

1. එය පැරණි කාලයේ සිට පැවත එන සිරිතක් නිසා
2. එය අපේ රාජකාරියක් නිසා
3. පොදු දේපල යනු අප සැමට ම අයත් දේ නිසා

02. යහපත් දරුවකු ලෙස අප සියලු දෙනා තුළ ම තිබිය යුතු ගුණාංගයක් වන්නේ මින් කුමක් ද?

1. උඩඟු බව     2. ආත්ම අභිමානය     3. හීනමානය

03. ශ්‍රී ලංකාව සෞභාග්‍යමත් රටක් බව කියවෙන්නේ ජාතික ගීයට අයත් පහත සඳහන් පද අතරින් කුමන පදයෙන් ද?

1. සුන්දර සිරි බරිනි අති සෝබමාන ලංකා
2. ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය ලංකා
3. අප හට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා

04. අතු කැබලි, දඬු සිටවීම මගින් පැළ ලබා ගත නොහැකි ශාකයක් වන්නේ මින් කුමක් ද?

1. නිවිති     2. බතල     3. මිරිස්

05. සාමාන්‍යයෙන් ජාතික කොඩිය ඔසවන අවස්ථාවක් නොවන්නේ මින් කුමක් ද?

1. ජාතික වීර දිනයේ දී

2. ජනාධිපතිතුමා දිවුරුම් දෙන උත්සවයේ දී

3. පොසොන් උත්සවයේ දී

06. කොළපොත අපට ලැබෙන්නේ කුමන ශාකයෙන් ද?

1. තල් ගසෙන් 2. පොල් ගසෙන් 3. පුවක් ගසෙන්

07. ගොවියාගේ මිතුරකු ලෙස සැලකිය හැකි කෘමි සතා වන්නේ මින් කවරෙක් ද?

1. ගෙමැස්සා 2. ඉල් මැස්සා 3. මී මැස්සා

08. ඉදිරියේ දී වෙනත් සතෙක් බවට පත් වීමට ඉඩ ඇති සතා කවු ද?

1. ලේනා 2. දළඹුවා 3. මකුළුවා

09. අතු ගෑමෙන් පසු ඉදලේ ඉරටු උඩ අතට තැබිය යුත්තේ ඇයි?

1. ඉරටුවලට බර පැමිණ ඒවා කැඩී යාම වැළැක්වීමට

2. ඉදලේ ඉරටු හොඳින් වේළීමට

3. ඉරටුවලට හොඳින් වාතාශ්‍රය ලැබීමට

10. මුදවපු කිරි, යෝගට්, කිරි වැනි දේ කල් ඉකුත් වූ විට සිදුවිය හැකි දෙයක් නොවන්නේ මින් කුමක් ද?

1. කහ පාටට හුරු පාටක් ගැනීම 2. ගඳ ගැසීම 3. අයිස් බවට පත්වීම

11. ධීවර කර්මාන්තයේ දී භාවිත කරන උපකරණයක් වන්නේ මින් කුමක් ද?

1. අතංගුව 2. අලවංගුව 3. කෝදුව

12. සෙංගමාලය රෝගය පැතිර යන්නේ මින් කුමක් නිසා ද?

1. අපිරිසිදු ජලය 2. අපිරිසිදු වාතය 3. මැස්සන් නිසා

13. පොළොවේ ගැඹුරින් ඇති භූගත ජලය ප්‍රයෝජනයට ගන්නා අවස්ථාවක් වන්නේ මින් කුමක් ද?

1. ගංගා මගින් 2. ඇළ දොළ මගින් 3. නළ ළිං මගින්

14. හුමාලයෙන් ක්‍රියාකරන ක්‍රීඩා භාණ්ඩයක් වන්නේ මින් කුමක් ද?

1. රබර් ඇට කරත්තය 2. හුමාල බෝට්ටුව 3. බයිසිකලය

15. පා ගමනින් යන අය රාත්‍රී කාලයේ දී ඇඳිය යුත්තේ කුමන වර්ණයක ඇඳුම් ද?

1. කළු 2. සුදු 3. දම්

16. පහත සඳහන් මාර්ග වර්ග අතරින් වෙනස් ම මාර්ග වර්ගය කුමක් ද?

1. කොන්ක්‍රීට් මාර්ග 2. ප්‍රධාන මාර්ග 3. දුම්රිය මාර්ග

17. ශාකයක කඳ සාමාන්‍යයෙන් වැඩෙන්නේ කුමන දිශාවට නැඹුරුව ද?

1. හිරු එළිය ඇති දිශාවට

2. හිරු එළිය ලැබෙන දිශාවට විරුද්ධ දිශාවට

3. සුළං හමන දිශාවට

18. ගෙවත්තේ ඉවත ලන අපද්‍රව්‍ය ප්‍රයෝජනවත් ව බැහැර කිරීමට යොදා ගත හැකි සුදුසු ම ක්‍රමය වන්නේ මින් කුමක් ද?

1. ජීව කොටුවක් සකස් කිරීම 2. වළක් කපා වළ දැමීම 3. පුළුස්සා දැමීම

19. බරක් ඉහළට එසවීම සඳහා යොදා ගන්නා සරල ඇටවුමක් වන්නේ මින් කුමක් ද?

1. කප්පිය 2. නගුල 3. කැස්ටර් වීල්

20. චුම්බක දෙකක් එකිනෙක ආකර්ෂණය වන නිවැරදි ක්‍රමය මින් කුමක් ද?

1. [S | N] [N | S] 2. [N | S] [N | S]

3. [N | S] [S | N]

21. එවරස්ට් කන්ද තරණය කළ පළමු ශ්‍රී ලාංකික කාන්තාව වන්නේ,

1. සුසන්තිකා ජයසිංහ 2. දමයන්ති දර්ශා 3. ජයන්ති කුරුඋතුම්පාල

22. ඔලිම්පික් තරගයක දී හොඳ ම පරාජිතයෙකු ලෙස ලෝකයේ අවධානය දිනා ගත් ශ්‍රී ලාංකික ක්‍රීඩකයෙකු වන්නේ,

1. ඩන්කන් වයිට් 2. සුගත් තිලකරත්න 3. රණතුංග කරුණානන්ද

23. එල්ලේ ක්‍රීඩාවේ දී එක පිළකට සිටින ක්‍රීඩකයන් ගණන වන්නේ,

1. 6යි. 2. 16යි. 3. 11යි.


24. දේදුන්නක ඇති වර්ණ ගණන


1. 6යි. 2. 7යි. 3. 8යි.


25. 2020 වර්ෂයේ දී අප සමරනු ලැබුවේ,

1. 71 වන නිදහස් දිනය 2. 72 වන නිදහස් දිනය 3. 73 වන නිදහස් දිනය

26. පුර පසළොස්වක පොහොය දිනට දැකිය හැකි සඳෙහි රූපය වන්නේ,

1. 

2. 

3. 

27. ශ්‍රී ලංකාවේ තිබෙන පළාත් ගණන,

1. 8කි. 2. 9කි. 3. 10කි.

28. ලෝහ ද්‍රව්‍ය එකට ගැටීමෙන් ශබ්දය ලබා ගන්නා සංගීත භාණ්ඩයක් වන්නේ,

1. උඩැක්කිය 2. තම්මැට්ටම 3. තාලම්පට

29. පරිසර දූෂණය වළක්වා ගෙන ගමනාගමනයෙහි යෙදීමට වඩාත් ම සුදුසු වාහනය වන්නේ,

1. යතුරුපැදිය 2. මෝටර් රථය 3. පාපැදිය

30. ඇට කැබලි දෙකක් සහිත ඇඟිල්ල වනුයේ,

1. මැදැඟිල්ල 2. සුළැඟිල්ල 3. මහපටැඟිල්ල